TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

7921

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත / විවෘත තරග විභාගය – 2017/ 2018 (2020)

## (01) මූල්‍ය ගණකාධිකරණය - I වන පත්‍රය

පැ තුනයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර (non programmable calculators) භාවිතයට ඉඩදෙනු ලැබේ.

**1.** සීමිත කැන්ඩි පොදු සමාගමේ 2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු. ('000) | බැර රු. ('000) |
|---|---|---|
| දේපල පිරියත සහ උපකරණ(2018 අප්‍රේල් 01 දිනට) | | |
| - ඉඩම් - ප්‍රත්‍යාගණිත අගයට........................................ | 4 000 | – |
| - කාර්යාල ගොඩනැගිල්ල - පිරිවැයට........................ | 5 000 | – |
| - බෙදාහැරීමේ මෝටර් රථ - පිරිවැයට........................ | 3 000 | – |
| - කාර්යාලයීය ගෘහ භාණ්ඩ - පිරිවැයට........................ | 500 | – |
| ක්ෂය සඳහා වෙන් කිරීම් (2018 අප්‍රේල් 01 දිනට) | | |
| - කාර්යාලයීය ගොඩනැගිල්ල ........................................ | – | 200 |
| - බෙදාහැරීමේ මෝටර් රථ ........................................ | – | 600 |
| - කාර්යාලයීය ගෘහ භාණ්ඩ ........................................ | – | 100 |
| ආයෝජිත දේපළ (Investment Property) - සාධාරණ වටිනාකමට (2018 අප්‍රේල් 01 දිනට) | 5 800 | – |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම් (2018 අප්‍රේල් 01 දිනට)....... | – | 100 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | – | 10 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය (2018 අප්‍රේල් 01 දිනට) ........................ | – | 1 200 |
| රඳවාගත් ඉපැයුම් (2018 අප්‍රේල් 01 දිනට) ........................ | – | 5 120 |
| දිගුකාලීන බැංකු ණය - 12% ........................................ | – | 5 000 |
| වෙළඳ ණයගැතියෝ ........................................ | 3 120 | – |
| වෙළඳ ණයහිමියෝ ........................................ | – | 2 700 |
| තොගය (පිරිවැයට)........................................ | 4 600 | – |
| විකුණුම් ........................................ | – | 14 180 |
| ආයෝජන දේපළ මත ලද කුලී ආදායම්........................ | – | 300 |
| විකුණුම් පිරිවැය ........................................ | 7 450 | – |
| ආයතන හා පරිපාලන වියදම් ........................................ | 1 140 | – |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ........................................ | 1 320 | – |
| මූල්‍ය හා වෙනත් වියදම්........................................ | 420 | – |
| ගෙවූ අතුරු ලාභාංශ ........................................ | 1 000 | – |
| බැංකු මුදල්........................................ | 3 410 | – |
| අතැති මුදල්........................................ | 740 | – |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු ........................ | 500 | – |
| කොටස් නිකුතු ගිණුම ........................................ | – | 2 500 |
| | **42 000** | **42 000** |

[දෙවන පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත :

1. 2019 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රුපියල් 4 400 000 කට තක්සේරු කොට ඇත.
2. දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් පරිදි ක්ෂය කළ යුතු වේ.

   කාර්යාලයීය ගොඩනැගිල්ල 2%

   බෙදාහැරීමේ මෝටර් රථ 20%

   කාර්යාලයීය ලීබඩු 10%
3. 2019 මාර්තු 31 දින වෘත්තීය තක්සේරුකරුවකු විසින් ඉඩම රුපියල් 4 500 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. කෙසේ නමුදු මේ පිළිබඳ කිසිදු ගැලපිල්ලක් තවම පොත්වල ගලපා නොමැත. වත්මන් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය මගින් මෙම ඉඩමට අදාළව පෙර කරන ලද ප්‍රත්‍යාගණනයන් මත හඳුනාගත් ප්‍රත්‍යාගණන ලාභ නිරූපණය කරයි.
4. 2017 අප්‍රේල් 01 දින රු. 1 000 000 මිලදී ගන්නා ලද බෙදා හැරීමේ මෝටර් රථයක් 2019 මාර්තු 31 දින රු. 800 000 කට විකුණා දමන ලදී. මෝටර් රථය විකිණීමෙන් ලද මුදල බැංකු ගිණුමට හරකොට විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු ගැලපිල්ලක් මේ සම්බන්ධව සිදු කර නොමැත.
5. සමාගමට රුපියල් 120 000 ක් අය විය යුතුව තිබූ ගණුදෙනුකරුවකු බුන්වත් බවට පත්ව ඇති බැවින් එම මුදල බොල් ණය ලෙස කපා හැරිය යුතු ය.
6. අවසන් වෙළඳ ණයගැතියන් මත 5% ක අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් සිදු කළ යුතු ය.
7. 2019 මාර්තු 31 දිනට පහත සඳහන් වියදම් උපචිතව ඇත.

   ප්‍රචාරණ වියදම් රුපියල් 300 000

   විගණන ගාස්තු රුපියල් 200 000
8. සමාගම විසින් 2019 මාර්තු මස තුළ රුපියල් 2 500 000 ක් සඳහා හිමිකම් කොටස් නිකුතුවක් සිදු කරන ලදී. මේ වෙනුවෙන් ලද මුදල් බැංකු ගිණුමට හරකර "කොටස් නිකුතු ගිණුම" ට බැර කර ඇත.
9. මූල්‍ය හා වෙනත් වියදම් තුළ 12% දිගුකාලීන බැංකු ණය වෙනුවෙන් මාස 6 ක් සඳහා පමණක් ගෙවන ලද පොලිය අන්තර්ගත වේ. ඉතිරි මාස 6 සඳහා පොලිය 2019 මාර්තු 31 දිනට උපචිතව ඇත.
10. සමාගම විසින් ආයෝජන දේපළ මසකට රුපියල් 50 000 ක කුලියකට කුලියට දී ඇත. කුලී ආදායම් ගිණුමේ ශේෂය මගින් මාස 6 ක් පමණක් සඳහා ලද කුලිය පෙන්නුම් කරන අතර ඉතිරි මාස 6 සඳහා කුලිය ලැබිය යුතුව ඇත.
11. 2019 මාර්තු 31 දිනට ආයෝජන දේපළ හි සාධාරණ වටිනාකම රුපියල් 6 000 000 කට තක්සේරු කර ඇත.
12. ප්‍රවර්තන වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම් රු 700 000 කට තක්සේරු කොට ඇත.

අවශ්‍ය වන්නේ ;

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 1 (මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම) ට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත කැන්ඩි පොදු සමාගමේ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළත්ව)

(i) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(ii) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

(iii) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

*(ලකුණු 40 යි)*

[තුන්වන පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



2. සීමිත සමගි පොදු සමාගමේ 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර කළමනාකරුවන්ගේ කාර්යය සාධනය (Performance) මැනීම සඳහා පිළියෙල කරන ලද ලාභාලාභ ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, අදාළ පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු ද සමග පහත දැක්වේ.

2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය

| | 2019 (රුපියල්) | 2018 (රුපියල්) |
|---|---|---|
| විකුණුම් | 160 000 | 120 000 |
| විකුණුම් පිරිවැය | (90 000) | (70 000) |
| දළ ලාභය | 70 000 | 50 000 |
| පරිපාලන වියදම් | (12 000) | (11 000) |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | (24 000) | (15 000) |
| පොලී වියදම් | (3 000) | (1 000) |
| බදු පෙර ලාභය | 31 000 | 23 000 |
| බදු වියදම | (8 000) | ( 6 000) |
| බදු පසු ලාභය | 23 000 | 17 000 |
| ගෙවූ අතුරු ලාභාංශ | (10 000) | (8 000) |
| රඳවාගත් ඉපයීම් | 13 000 | 9 000 |

2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2019 (රුපියල්) | 2018 (රුපියල්) |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ | 168 000 | 140 000 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 12 700 | 4 000 |
| වෙළඳ ණයගැතියෝ | 6 200 | 8 000 |
| මුදල් | 3 100 | 3 000 |
| **මුළු වත්කම්** | **190 000** | **155 000** |
| **හිමිකම** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 100 000 | 100 000 |
| රඳවාගත් ඉපයුම් | 51 800 | 38 800 |
| **ජංගම නොවන වගකීම්** | | |
| ණයකර | 15 000 | 5 000 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු පොලී | 1 200 | 600 |
| ගෙවිය යුතු බදු | 800 | 200 |
| වෙළඳ ණය හිමියෝ | 21 200 | 10 400 |
| **හිමිකම හා මුළු වගකීම්** | **190 000** | **155 000** |

අතිරේක තොරතුරු ;

1. ප්‍රකාශිත ප්‍රාග්ධනය මගින් සාමාන්‍ය කොටස් 10 000 ක් නියෝජනය කරයි.
2. 2019 මාර්තු 31 ට හා 2018 මාර්තු 31 දිනට කොටසක අවසන් වෙළඳ මිල ගණන් පිළිවෙලින් රු. 24 ක් හා රු. 15 ක් විය.

අවශ්‍ය වන්නේ ;

(i) මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය කිරීමේ ශිල්පක්‍රමයක් ලෙස ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණයේ ඇති සීමාකම් හතරක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

[ගතරවන පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



(ii) සීමිත සමගි පොදු සමාගමේ 2019 හා 2018 වර්ෂ සඳහා පහත සඳහන් ගිණුම්කරණ අනුපාතයන් ගණනය කරන්න.

- දළ ලාභ අනුපාතය
- ශුද්ධ මෙහෙයුම් ලාභ අනුපාතය
- හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය
- ණය ප්‍රාග්ධනයට හිමිකම් අනුපාතය
- ජංගම අනුපාතය
- ක්ෂණික වත්කම් අනුපාතය
- පොලී ආවරණ අනුපාතය
- කොටසක ඉපැයුම (EPS)
- කොටසක ලාභාංශය (DPS)
- මිල ඉපැයුම් අනුපාතය

*(ලකුණු 10 යි)*

(iii) ඉහත ගණනය කරන ලද අනුපාතයන් අතරින් උචිත අනුපාතයන් යොදා ගනිමින් සමගි පොදු සමාගමේ ලාභදායිකත්වය හා කෙටි කාලීන මූල්‍ය තත්ත්වය පිළිබඳව අදහස් දක්වන්න. *(ලකුණු 04 යි)*

(iv) කෙටි කාලීන මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණ දී ඇති සමාගමකට එම තත්ත්වය වලක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි උපාය මාර්ග දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(v) ව්‍යාපාරයක ලාභදායිත්වය හා ද්‍රවශීලතාව අතර පවත්නා සබඳතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 20 යි)*

**3.** (i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක - 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) ට අනුව පහත දැක්වෙන යෙදුම් නිර්වචනය කරන්න.

(අ) මෙහෙයුම් කටයුතු

(ආ) ආයෝජන කටයුතු

(ඉ) මූල්‍ය කටයුතු

(ii) සීමිත හෙළදිව පොදු සමාගමේ 2019 වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ.

2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය

| | රු. ('000) |
|---|---|
| විකුණුම් | 12 800 |
| විකුණුම් පිරිවැය | (7 650) |
| දළ ලාභය | 5 150 |
| වෙනත් ආදායම් | 50 |
| බෙදාහැරීමේ වියදම් | (1 245) |
| පරිපාලන වියදම් | (855) |
| මූල්‍ය පිරිවැය | (400) |
| බදු පෙර ලාභය | 2 700 |
| බදු වියදම | (750) |
| බදු පසු ලාභය | 1 950 |
| ගෙවූ අතුරු ලාභාංශ | (500) |
| රඳවාගත් ලාභය | 1 450 |

[පස්වන පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | 2019 (රු' 000) | 2018 (රු' 000) |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ පිරියත හා උපකරණ | 11 500 | 9 500 |
| ආයෝජන | – | 800 |
| ජංගම වත්කම් | | |
| තොගය | 2 550 | 1 400 |
| වෙළඳ ණයගැතියෝ | 460 | 380 |
| මුදල් | 790 | 120 |
| **මුළු වත්කම්** | **15 300** | **12 200** |
| **හිමිකම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 7 500 | 5 000 |
| රඳවාගත් ඉපයුම් | 4 950 | 3 500 |
| ජංගම නොවන වගකීම් | | |
| 12% ණයකර | 1 000 | 2 500 |
| ජංගම වගකීම් | | |
| ගෙවිය යුතු පොලී | 80 | 40 |
| ගෙවිය යුතු ලාභාංශ | 470 | 310 |
| වෙළඳ ණයහිමියෝ | 1 300 | 850 |
| **හිමිකම හා මුළු වගකීම්** | **15 300** | **12 200** |

**අතිරේක තොරතුරු ;**

1. කාලච්ඡේදය තුළ දී සමාගම විසින් සිය ආයෝජන රු 900 000 කට විකුණා ඇත.
2. පිරිවැය රු. 250 000 ක් හා ධාරණ අගය රු. 200 000 ක් වූ යන්ත්‍රයක් කාලච්ඡේදය තුළදී රු. 150 000 කට විකුණා ඇත.
3. පහත තොරතුරු සමාගමේ දේපළ, පිරියත හා උපකරණ හා අදාළ වේ.

| | 2019 (රු' 000) | 2018 (රු' 000) |
|---|---|---|
| පිරිවැය | 14 650 | 12 000 |
| සමුච්චිත ක්ෂය | 3 150 | 2 500 |
| ධාරණ අගය | 11 500 | 9 500 |

4. කාලච්ඡේදය තුළ දී සමාගම විසින් රු. 2 500 000 ක හිමිකම් නිකුතුවක් සිදු කර ඇත

**අවශ්‍ය වන්නේ ;**

සීමිත හෙළදිව පොදු සමාගමේ 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමයට)

*(ලකුණු 20 යි)*

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



**4.** සීමිත බොනීටා පුද්ගලික සමාගමේ බැංකු ගණුදෙනු හා සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

| | රු. | රු. |
|---|---|---|
| මුදල් පොතට අනුව බැංකු ශේෂය | | 50 000 |
| නිකුත් කළ නමුදු ඉදිරිපත් නොකළ චෙක්පත් | | |
| චෙක්පත් අංක 124567 | 30 000 | |
| චෙක්පත් අංක 124572 | 50 000 | 80 000 |
| උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| චෙක්පත් අංක 45678 | 20 000 | |
| චෙක්පත් අංක 56789 | 40 000 | (60 000) |
| බැංකු ප්‍රකාශයට අනුව බැංකු ශේෂය | | 70 000 |

2020 ජනවාරි 31න් අවසන් මාසය සඳහා මුදල් පොත (ජංගම ගිණුම)

| | රු. | | රු. |
|---|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය (2020.01.01) | 50 000 | ණයහිමියෝ - චෙක්පත් අංක 124575 | 15 000 |
| ණයගැතියෝ - චෙක්පත් අංක 67890 | 40 000 | ණයහිමියෝ - චෙක්පත් අංක 124576 | 20 000 |
| ණයගැතියෝ - චෙක්පත් අංක 78901 | 50 000 | වැටුප් - චෙක්පත් අංක 124577 | 80 000 |
| මුදල් තැන්පතු | 100 000 | ණයහිමියෝ - චෙක්පත් අංක 124578 | 30 000 |
| ණයගැතියෝ - චෙක්පත් අංක 89012 | 20 000 | ණයහිමියෝ - චෙක්පත් අංක 124579 | 18 000 |
| ණයගැතියෝ - චෙක්පත් අංක 66001 | 35 000 | ශේෂය | **132 000** |
| | **295 000** | | **295 000** |

2020 ජනවාරි 31න් අවසන් මාසය සඳහා සංක්ෂිප්ත බැංකු ප්‍රකාශය

| | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|
| ශේෂය (2020.01.01) | – | – | 70 000 |
| චෙක් තැන්පතු 45678 | – | 20 000 | 90 000 |
| චෙක් තැන්පතු 56789 | | 40 000 | 130 000 |
| චෙක්පත් අංක 124575 | 15 000 | – | 115 000 |
| චෙක් තැන්පතු 67890 | | 40 000 | 155 000 |
| චෙක් තැන්පතු 78901 | | 50 000 | 205 000 |
| චෙක්පත් අංක 124576 | 20 000 | – | 185 000 |
| චෙක්පත් අංක 124567 | 30 000 | – | 155 000 |
| මුදල් තැන්පතු | | 100 000 | 255 000 |
| චෙක්පත් අංක 124577 | 80 000 | | 175 000 |
| ලාභාංශ ප්‍රේෂණ | | 15 000 | 190 000 |
| රක්ෂණ වාරිකය SLIC | 30 000 | | 160 000 |
| බැංකු ගාස්තු | 5 000 | | **155 000** |

අවශ්‍ය වන්නේ ;

(i) සංශෝධිත මුදල් පොත

(ii) 2020 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

(iii) ආයතනයක් විසින් චෙක්පත් මගින් ගෙවීම් සිදු කිරීමේදී අනුගමනය කළ හැකි මනා අභ්‍යන්තර පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

*(ලකුණු 10 යි)*

[ඉත්වන පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



**5.** (i) පරිගණකගත ගිණුම්කරණ පද්ධතියකට අදාළ ආවේණික අවදානම් (inherent risk factors) හතරක් සඳහන් කරන්න.

(ii) පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක දත්ත ආරක්ෂාව සඳහා අනුගමනය කළ හැකි මනා අභ්‍යන්තර පාලන ක්‍රම හතරක් සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණ හා අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් රජය උනන්දුවක් දැක්වීමට හේතු හතරක් සඳහන් කරන්න.

(iv) "වෝහාරික ගිණුම්කරණය (Forensic Accounting)" කෙටියෙන් පැහැදිලි කරන්න.

*(ලකුණු 10 යි)*

* * *

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE 7921

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය – 2017/2018 (2020)

## (02) මූල්‍ය ගණකාධිකරණය - II වන පත්‍රය

පැ. තුනයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර (non programmable calculators) භාවිතයට ඉඩදෙනු ලැබේ.

---

**1.** ලාභ හා අලාභ සමානව බෙදා ගනිමින් ගීතා සහ සීතා හවුල් ව්‍යාපාරයක නිරත වෙමින් සිටිති. 2018.04.01 දින නව හවුල්කරුවකු ලෙස නීතා ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. පහත තොරතුරු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ක්‍රියාකාරකම්වලට අදාළ වේ.

- නීතා මුදලින් රුපියල් 300 000 ක් සහ රුපියල් 200 000 ක වටිනාකමට උපකරණ ඇයගේ ප්‍රාග්ධන කොටස ලෙස ගෙන එන ලදී.
- හවුල් ගිවිසුමේ පහත වගන්ති ඇතුළත් වේ.
  1. ගීතා, සීතා සහ නීතා අතර ලාභ සහ අලාභ පිළිවෙළින් 3 : 3 : 2 අනුපාතයට බෙදා ගැනීම
  2. හවුල් කරුවන්ගේ සංයුතියේ හා ලාභ හා අලාභ බෙදා ගැනීමේ අනුපාතයේ වෙනසක් සිදුවන සෑම අවස්ථාවකම හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය ඇස්තමේන්තු කිරීම.
  3. ගීතා සහ නීතා පිළිවෙළින් රුපියල් 30 000 හා රුපියල් 25 000 බැගින් මාසික වේතනයකට හිමිකම් ලබයි.
  4. වාර්ෂික එකවර වේතනයක් ලෙස රු 150 000 ක් සීතාට ගෙවනු ලබයි.
  5. ආයෝජනය කළ ස්ථාවර ප්‍රාග්ධනය මත 10% ක වාර්ෂික පොළියක් හවුල්කරුවන්ට හිමි වේ.
  6. හවුල්කරුවන් විසින් ව්‍යාපාරය වෙනුවෙන් කරනු ලබන වියදම් හවුල් ව්‍යාපාරය විසින් ප්‍රතිපූර්ණය කරනු ලබයි.
  7. හවුල්කරුවන් ව්‍යාපාරයට ලබා දුන් ණය සඳහා හවුල්කරුවන්ට 15% ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුයි.
  8. හවුල්කරුවන් විසින් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලද භාණ්ඩ ලැයිස්තු ගත මිලෙන් 10% ක් අඩු කිරීමෙන් පසු අයභාරය ලෙස සැලකිය යුතුයි.
- 2018.04.01 ව්‍යාපාරයේ කීර්තිනාමය රුපියල් 800 000 ලෙස ඇස්තමේන්තු කළ අතර එම ගැලපීම් ප්‍රාග්ධන ගිණුම්වල සිදු කිරීමට හවුල්කරුවන් එකඟ විය.
- තවමත් ප්‍රතිපූර්ණය කර නොමැති හා ගිණුම්ගත කර නොමැති හවුල්කරුවන් විසින් ව්‍යාපාරය වෙනුවෙන් කළ වියදම්
  - ➤ ගීතා විසින් රක්ෂණ වාරික සඳහා රුපියල් 60 000
  - ➤ සීතා විසින් විදුලි බිල් සඳහා රුපියල් 23 000
  - ➤ නීතා විසින් දුරකථන බිල් සඳහා රුපියල් 48 000
- සීතාට ගෙවූ වාර්ෂික එක්වර වේතනය හා 2019 පෙබරවාරි දක්වා ගීතා හා නීතාට ගෙවූ වේතන, කෙටුම්පත් ලාභය ගණනය කිරීමේදී වියදම් ලෙස හඳුනාගෙන ඇත.
- ගීතා ව්‍යාපාරයෙන් ලබාගෙන ඇති ලැයිස්තුගත මිල රුපියල් 80 000 ක් වූ භාණ්ඩ ගිණුම්ගතකර නොමැත.

[ 2 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



- කෙටුම්පත් ලාභය ගණනය කිරීමෙන් පසු 2019.03.31 දිනට ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | රුපියල් '000 | රුපියල් '000 |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 2 315 | |
| කුලී අත්තිකාරම් | 360 | |
| කලින් ගෙවූ කුලී | 225 | |
| තොග | 265 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 160 | |
| මුදල් | 375 | |
| ප්‍රාග්ධන ගිණුම් - ගීතා | | 600 |
| ප්‍රාග්ධන ගිණුම් - සීතා | | 600 |
| ප්‍රාග්ධන ගිණුම් - නීතා | | 500 |
| ජංගම ගිණුම් - ගීතා | 100 | |
| ජංගම ගිණුම් - සීතා | | 260 |
| ජංගම ගිණුම් - නීතා | 200 | |
| ණය - ගීතා | | 500 |
| වර්ෂයේ ලාභය | | 1 160 |
| ජංගම වගකීම් | | 380 |
| | **4 000** | **4 000** |

- සීතාට අයිති ගොඩනැගිල්ලක ව්‍යාපාරය පවත්වාගෙන යන අතර ඒ සඳහා 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා මසකට රු. 30 000 ක කුලියක් ගෙවිය යුතුයි. පසුගිය වර්ෂය සඳහා මාසික කුලිය රුපියල් 25 000 ක් විය. අවුරුද්දක කුලිය සෑම වර්ෂයකම ජනවාරි 1 දින කලින් ගෙවනු ලබන අතර ආසන්නතම ගෙවීම කුලී අත්තිකාරම් ගිණුමට පිටපත් කර ඇත. කලින් ගෙවූ කුලී ගිණුමෙන් නියෝජනය වන්නේ 2018.03.31 දිනට තිබූ ශේෂයයි.
- මෝස්තර කුසලතා සඳහා නීතා රුපියල් 120 000 ක වාර්ෂික දීමනාවකට හිමිකම් ලබන අතර තවමත් එම ගෙවීම් සිදුකර නොමැත.
- ගැනිලි ඇතුළු හවුල්කරුවන්ට සිදු කළ ගෙවීම් ඔවුන්ගේ ජංගම ගිණුම්වලට හර කර ඇත.
- නීතා විසින් ගෙන එන ලද යන්ත්‍ර සඳහා පිරිවැය මත 10% ක වාර්ෂික ක්ෂය හැර වර්ෂය සඳහා ක්ෂයවීම් නිවැරදිව වෙන් කර ඇත.

අවශ්‍ය දෑ :

(i) වර්ෂයේ ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනයක්

(ii) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම

(iii) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(iv) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම

(v) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

*(ලකුණු 30 යි)*

[ 3 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

7921

**2.** *X* හා *Y* නමැති භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කිරීම සඳහා තරිඳු විසින් 'ග්ලෝබ් නිෂ්පාදකයෝ' ව්‍යාපාරය 2017.04.01 දින ආරම්භ කරන ලදී. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී කර්මාන්ත ශාලාව ඉදි කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමටත් 2018.04.01 දින අලෙවිය සඳහා නිෂ්පාදනය ආරම්භ කිරීමටත් ඔහුට හැකිවිය. 'ග්ලෝබ් නිෂ්පාදකයෝ' ට අදාළව පහත තොරතුරු ලබා දී ඇත.

- 2017.04.01 සහ 2019.03.31 දක්වා මුදල් ලැබීම් හා ගෙවීම් සාරාංශය (රුපියල් දහස්)

| | හර (රු. 000) | බැර (රු. 000) | ශේෂය |
|---|---|---|---|
| තරිඳුගේ මූලික ආයෝජන | | | 18 000 |
| මෝටර් රථවාහන | | 6 000 | 12 000 |
| බැංකු ණය | 7 000 | | 19 000 |
| ගොඩනැගිලි | | 8 000 | 11 000 |
| යන්ත්‍ර | | 7 000 | 4 000 |
| විකුණුම් හා ගනුදෙනුකරුවන්ගේ එකතු කළ මුදල | 68 000 | | 72 000 |
| සෘජු ශ්‍රමය | | 12 480 | 59 520 |
| කර්මාන්තශාලා වැටුප් | | 7 500 | 52 020 |
| කාර්යාල වැටුප් | | 1 900 | 50 120 |
| කර්මාන්තශාලා නඩත්තු | | 1 710 | 48 410 |
| ගොඩනැගිලි රක්ෂණය | | 150 | 48 260 |
| වරිපනම් | | 50 | 48 210 |
| මෝටර් රථ වාහන අලුත්වැඩියාව හා රක්ෂණය | | 300 | 47 910 |
| යන්ත්‍ර අලුත්වැඩියාව | | 1 680 | 46 230 |
| කර්මාන්තශාලා සේවක අතිකාල ගෙවීම් | | 5 620 | 40 610 |
| අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවීම් | | 11 750 | 28 860 |
| සේවක අර්ථ සාධක අරමුදල (EPF) ගෙවීම් | | 3 960 | 24 900 |
| සේවක භාරකාර අරමුදල (ETF) ගෙවීම් | | 660 | 24 240 |
| මෝටර් රථවාහන සඳහා ඉන්ධන | | 2 800 | 21 440 |
| කර්මාන්තශාලාව සඳහා ඉන්ධන හා බලය | | 1 400 | 20 040 |
| පුරස්කාර ගෙවීම් | | 1 400 | 18 640 |
| වෙනත් පරිපාලන වියදම් | | 4 600 | 14 040 |
| ඇසුරුම් ද්‍රව්‍ය | | 3 270 | 10 770 |
| *X* නිෂ්පාදනය සඳහා වක්‍ර ද්‍රව්‍ය | | 1 336 | 9 434 |
| *Y* නිෂ්පාදනය සඳහා වක්‍ර ද්‍රව්‍ය | | 4 | 9 430 |
| තරිඳුගේ ගැනිලි | | 500 | 8 930 |
| 2019.03.31 දින නව යන්ත්‍ර මිලදී ගැනීම | | 6 500 | 2430 |
| ණය ආපසු ගෙවීම් (පොළිය රුපියල් 500 000 ඇතුළුව) | | 1 900 | 530 |

- රුපියල් මිලියන 10ක වෙළඳපොළ වටිනාකමක් තිබූ, තම මව විසින් පරිත්‍යාග කරන ලද ඉඩම ඇපයට තබමින් තරිඳු ව්‍යාපාරය සඳහා 2017.04.01 දින බැංකු ණයක් ලබා ගන්නා ලදී. පළමු වර්ෂය සඳහා බැංකුව පොලිය අය නොකළ අතර, ආපසු ගෙවීම් ආරම්භ වූයේ 2019.03.31 දින සිටය.
- ගොඩනැගිලි ඉදි කරන ලද්දේ කර්මාන්ත ශාලාවෙහි හා කාර්යාලයෙහි ප්‍රයෝජනය සඳහා ය.
- *X* හා *Y* භාණ්ඩ දෙකෙහිම ඒකකයක් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය භාවිත වන්නේ එකම අනුපාතයෙනි.

TO BE PUBLISHED IN THE W... ...OE



- $X$ හා $Y$ භාණ්ඩ සඳහා සෘජු ශ්‍රමය පිළිවෙළින් 2 : 1 අනුපාතයට යොදවයි
- $X$ හා $Y$ භාණ්ඩ සඳහා නිශ්චිතව දක්වා නොමැති නිෂ්පාදන පොදුකාර්ය, නිෂ්පාදන ධාරිතාව පදනම් කර ගනිමින් $X$ හා $Y$ අතර බෙදිය යුතු ය.
- නිෂ්පාදන හා විකුණුම් වාර්තා පහත දී ඇත.

| | **X (ඒකක)** | **Y (ඒකක)** |
|---|---|---|
| මුළු නිෂ්පාදනය | 80 000 | 120 000 |
| මුළු විකුණුම් | 69 000 | 115 000 |
| නොවිකුණු නිෂ්පාදිතය | 10 000 | 5 000 |
| අපතේ යෑම | 1 000 | 0 |

- 2019.03.31 දිනට පැවති අමුද්‍රව්‍ය පිරිවැය රුපියල් මිලියන 4 කි.
- ගොඩනැගිලි වලින් 3/5 ක් පාවිච්චි වන්නේ කර්මාන්තශාලාව සඳහා ය.
- වැටුපෙන් අඩුකළ 8% ක සේවක අර්ථසාධක අරමුදල් (EPF) දායකය සමග ආයතනයේ 12% ක EPF දායකය හා 3% ක සේවක භාරකාර අරමුදල් (ETF) දායකය නිසි පරිදි සෑම මසකම අවසාන දින ගෙවා ඇත. වර්ෂය සඳහා අතිකාල ගෙවීම් හැර EPF හා ETF අඩුකිරීම් හා ගෙවීම් හා වැටුප් සාරාංශය පහත වගුවේ දී ඇත. (රු. '000 වලින්).

| | කර්මාන්තශාලා සෘජු | කර්මාන්තශාලා වක්‍ර | කාර්යාලය |
|---|---|---|---|
| දළ වැටුප් | 12 000 | 8 000 | 2 000 |
| සේ.අ.අ. (EPF) අඩු කිරීම් 8% | – 960 | – 640 | – 160 |
| සේ.අ.අ. හා සේ.භා.අ. අදාළ නොවන දීමනා | 1 440 | 140 | 60 |
| **ශුද්ධ වැටුප** | **12 480** | **7 500** | **1 900** |
| සේවායෝජකගේ දායකත්වය | | | |
| - සේ.අ.අ. 12% | 1 440 | 960 | 240 |
| - සේ.භා.අ. 3% | 360 | 240 | 60 |

- මෝටර් රථවාහනවලට අදාළ වියදම්වලින් 50% ක් නිෂ්පාදන පිරිවැය ලෙස හඳුනා ගත යුතුයි.
- යන්ත්‍ර හා මෝටර් රථවාහන පිළිවෙළින් වර්ෂ 4 ක් හා 5 ක් පාවිච්චි කිරීමට බලාපොරොත්තු වේ.
- ගොඩනැගිලි වර්ෂ 40ක් පවතී යැයි අපේක්ෂා කෙරේ.
- නිෂ්පාදන $X$ හා $Y$ එක් අයිතමයක් සඳහා රුපියල් 10ක පුරස්කාර ගාස්තුවක් ගෙවිය යුතු ය.
- දෙන ලද තොරතුරු වලින් පැන නගින අයිතම හැර 2019.03.31 දිනට වත්කම් හා වගකීම් පහත පරිදි විය.

| | රු. '000 |
|---|---|
| ගනුදෙනුකරුවන්ගෙන් එකතු කර ගත යුතු මුදල් | 2 400 |
| භාවිත නොකළ ඇසුරුම් අමුද්‍රව්‍ය | 370 |
| අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 7 250 |

අවශ්‍ය වන්නේ :

(i) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම

(ii) නිෂ්පාදන $X$ හා $Y$ ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ ප්‍රකාශනයක්

(iii) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ නිෂ්පාදන හා පරිපාලන කාර්යයන් සඳහා වැයවූ මුළු ශ්‍රම පිරිවැය

(iv) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය (සැ.යු. ශුද්ධ වත්කම් වෙනස භාවිත කරන්න)

(ලකුණු 20 යි)

[ 5 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WE... ...CE



**3.** රජයේ ගණකාධිකාරීවරුන් ස්ථාපිත කළ සංගමයක 2019.03.31 දින සිටි සාමාජික සංඛ්‍යාව 1000 ක් වූ අතර ඔවුන්ගෙන් 100 දෙනෙකු සංගමයට බැඳී ඇත්තේ 2019.01.01 දිනය. සාමාජිකයකුගේ මාසික දායක මුදල රුපියල් 50 කි. සංගමයට ආදායම් ලබා ගැනීම සඳහා පොත් සාප්පුවක් පවත්වා ගෙන යයි. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

- සාමාජික ගාස්තු වැටුපෙන් අඩුකර සංගමයේ බැංකු ගිණුමට සෘජුව ප්‍රේෂණය කරනු ලබයි. කෙසේ නමුත් යම් ගැටළුවක් නිසා මාර්තු මාසයේ දායක මුදල් බැංකුවට යවා ඇත්තේ 2019.04.20 දින ය.
- ස්ථාවර තැන්පතුව සඳහා 10% ක වාර්ෂික පොලියක් ලැබෙන අතර 2018.03.31 දිනට උපචිත වූ පොලිය තැන්පතුවට එකතු කර ඇති අතර ප්‍රවර්තන වර්ෂය සඳහා පොලී 2019.04.10 දින සංගමයේ බැංකු ගිණුමට මාරු කර ඇත.
- බැංකු ගිණුමේ සාරාංශය

| | රුපියල් | රුපියල් |
|---|---|---|
| 2018.04.01 දිනට ශේෂය | | 526 500 |
| **ලැබීම්** | | |
| පොත් සාප්පුවෙන් ලැබීම් | 1 845 000 | |
| දායක මුදල් | 505 000 | |
| පරිත්‍යාග | 84 000 | |
| පරණ පුවත්පත් අලෙවිය | 2 500 | |
| | | 2 436 500 |
| | | 2 963 000 |
| **ගෙවීම්** | | |
| පොත් ප්‍රකාශකයන්ට ගෙවීම් | 782 000 | |
| පොත් සාප්පුවේ සේවක වැටුප් | 450 000 | |
| පොත් සාප්පුවේ කුලී | 150 000 | |
| විදුලිය | 98 000 | |
| ජලය | 32 000 | |
| දුරකථන ගාස්තු | 46 000 | |
| සුළු මුදල් වියදම් | 80 000 | |
| වාර්ෂික මහා සභා රැස්වීමේ වියදම් | 424 100 | |
| ගමන් වියදම් | 31 500 | |
| ලිපිද්‍රව්‍ය | 24 000 | |
| සුබසාධන වියදම් | 316 400 | |
| රූපවාහිනී යන්ත්‍රය | 62 000 | |
| විගණන ගාස්තු | 15 000 | 2 511 000 |
| 2019.03.31 දිනට ශේෂය | | 452 000 |

- සුළු මුදල් සාරාංශය

| | රුපියල් | රුපියල් |
|---|---|---|
| 2018.04.01 දිනට ශේෂය | | 12 000 |
| භාණ්ඩාගාරිකගෙන් ලද මුදල | | 80 000 |
| | | 92 000 |
| **ගෙවීම්** | | |
| ආහාර ද්‍රව්‍ය | 64 000 | |
| ෆොටෝකොපි ගාස්තු | 1 900 | |
| තැපැල් ගාස්තු | 4 800 | |
| ගමන් වියදම් | 2 100 | |
| පුවත්පත් | 12 700 | 85 500 |
| 2019.03.31 දිනට ශේෂය | | 6 500 |

[ 6 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



- දේපළ පිරියත හා උපකරණ පිරිවැය මත වාර්ෂිකව 10% ක් ක්ෂය කළ යුතු අතර එය පොත් සාප්පුවට අදාළ වේ.
- සංගමය සඳහා 2019.03.31 දින රූපවාහිනියක් මිලදී ගන්නා ලදී.
- දෙන ලද තොරතුරුවලින් පැන නගින අයිතමයන්ට අමතරව අතිකුත් වත්කම් හා වගකීම්

| | 31.03.2019 | 31.03.2018 |
|---|---|---|
| දේපළ පිරිවැය හා උපකරණ | ? | 120 000 |
| බැංකුවේ ස්ථාවර තැන්පතු | ? | 1 100 000 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 20 000 | 15 000 |
| පොත් සාප්පුවේ මුදල් ශේෂය | 25 000 | 0 |
| පොත් තොගය | 450 000 | 370 000 |
| පොත් ප්‍රකාශකයන්ට ගෙවිය යුතු දෑ | 120 000 | 90 000 |

අවශ්‍ය වන්නේ :

(i) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොත් සාප්පුවේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය

(ii) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ ආදායම් හා වියදම් ප්‍රකාශනය

(iii) 2019.03.31 දිනට සංගමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු *20 යි*)

**4.** (A) රුපියල් මිලියන 10කට පාසල් ගොඩනැගිල්ලක් ඉදිකරදීම සඳහා වූ ලංසු තැබීමකට අදාළ කොන්ත්‍රාත්තුවක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2018 ජුනි 30 දින 'Pile' ඉදිකිරීම් ආයතනයට ලබා දෙන ලදී.

පහත තොරතුරු මෙම ඉදිකිරීමට අදාළ වේ.

- අතිරේක වැඩ හේතුවෙන් කොන්ත්‍රාත්තු මිල රුපියල් මිලියන 12ක් ලෙස 2018 දෙසැම්බර් මාසයේ දී සංශෝධනය කරන ලදී.
- ආරම්භක පිරිවැය ඇස්තමේන්තුව — රු. 8 600 000
- අතිරේක වැඩ පිරිවැය — රු. 1 400 000
- 2019.03.31 දිනට ඍජු පිරිවැය — රු. 8 300 000
- 2019.03.31 දිනට සහතික කළ වැඩ පිරිවැය — රු. 7 500 000
- 2019.03.31 දිනට ලද ප්‍රගති මත ගෙවීම් — රු. 6 000 000
- ආදායමෙන් රඳවීම් — 10%
  (මෙම රඳවුම් මුදල ගොඩනැගිල්ල භාරදීමෙන් මාස 03කට පසුව නිදහස් කළ යුතුයි)
- 2019 ජුනි 30 විට ඉදිකිරීම් නිමවූ අතර එය අමාත්‍යාංශයට භාරදෙන ලදී. කරන ලද සියලු වැඩ, ඉංජිනේරුවරුන් විසින් සහතික කරන ලද අතර ඉතිරි ගෙවීම් අනුමත කරන ලදී. කෙසේ නමුත් අගෝස්තු මස අගදී ගොඩනැගිල්ලේ ඉරි තැලීම් තිබෙන බව නිරීක්ෂණය වූ අතර එය කොන්ත්‍රාත්කරුට දැනුම් දෙන ලදී. අලුත්වැඩියා පිරිවැය රුපියල් 500 000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍ය වන්නේ :

(i) 2019.03.31 දිනෙන් හා 2020.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා Pile ඉදිකිරීම් ආයතනයේ ඉදිකිරීම් ගිණුම

(ii) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්

(ලකුණු *10 යි*)

[ 7 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



(B) ඉදිකිරීම් කාලපරිච්ඡේදය තුළ වැඩබිම් පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය අංශය ඉංජිනේරුවන්ට ගෙවීම් සිදු කරනු ලබයි. මෙම වියදම් 'පරිපාලන වියදම්' ශීර්ෂය යටතේ 'ප්‍රාග්ධන වියදම්' ලෙස සාමාන්‍යයෙන් අයවැය ගත කරනු ලබයි. එමනිසා, එවැනි වියදම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. කෙසේනමුත් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) 7, දේපළ පිරියත හා උපකරණ පරිපාලන වියදම් දේපල පිරියත හා උපකරණ පිරියතෙහි ඇතුළත් කළ නොහැකි බව සඳහන් කරයි.

(i) මෙම ප්‍රමිතියෙහි එම ප්‍රතිපාදනයට පසුබිම් වන තර්කනය පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) 7 යටතේ ම වුවද එවැනි වියදම් ප්‍රාග්ධනිත කිරීම සාධාරනීකරණය කරන්න.

*(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 15 යි)*

**5.** (i) "ආයතනයක ක්‍රියාකාරකම් ශාඛා මගින් සිදුවන විට වංචා වළක්වා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයේ කළමණාකරුවන් මුදල් හා තොග පාලනය පිළිබඳ අවධානය යොමු කරනු ලබයි."

භෞතික නිරීක්ෂණ හැර මුදල් හා තොග මත ප්‍රධාන කාර්යාලය විසින් කුමන ගිණුම්කරණ පාලන ස්ථාපිත කළ හැකි ද යන්නත් එවැනි පාලන ක්‍රම මත ශාඛා තුළ අවභාවිතයන් සිදු නොවන බව තහවුරු කර ගන්නේ කෙසේද යන්නත් පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(ii) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ආයතනයක ප්‍රධාන කාර්යාලය හා ශාඛාව අතර සිදුවූ ගනුදෙනු පහත දී ඇත.

| | පිරිවැය (රු. '000) | විකුණුම් මිළ (රු. '000) |
|---|---|---|
| 2018.04.01 දිනට ශාඛාවේ තොගය | 2 000 | 2 500 |
| ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට යැවූ භාණ්ඩ | 16 000 | 20 000 |
| ශාඛාව විසින් පසුව එවන ලද භාණ්ඩ | 1 000 | 1 250 |
| ශාඛාවේ විකුණුම් | | 17 500 |
| ගනුදෙනුකරුවන් විසින් ශාඛාවට එවූ භාණ්ඩ | 400 | 500 |
| ගනුදෙනුකරුවන් විසින් ප්‍රධාන කාර්යාලයට එවූ භාණ්ඩ | 600 | 750 |
| 2019.03.31 දිනට ශාඛාවේ තොග | 3 000 | 3 750 |

| | (රු. '000) |
|---|---|
| ශාඛාව විසින් මුදලින් සිදු කළ පරිපාලන වියදම් | 30 |
| ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාව සඳහා සිදු කළ පරිපාලන වියදම් | 10 |
| ශාඛා මෙහෙයුම් සඳහා ප්‍රධාන කාර්යාලය විසින් අය කළ යුතු ක්ෂය | 15 |
| ශාඛා කළමනාකරණය සඳහා අය කළ යුතු ගාස්තු | 25 |

සැ.යු. : මධ්‍යගත ගිණුම්ක්‍රමය භාවිත කරන්නේ යැයි උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ :

(i) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශාඛා තොග ගිණුම

(ii) ප්‍රධාන කාර්යාලයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ පෙන්විය යුතු ශාඛාවට යැවූ භාණ්ඩවල අගය

(iii) 2019.03.31 දිනෙන් අවසාන වර්ෂයේ ශාඛාව උපයන ලද ලාභය

*(ලකුණු 12 යි)*

*(මුළු ලකුණු 15 යි)*

* * *

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය – 2017/2018(2020)

(03) පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය

පැ තුනයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර (non programmable calculators) භාවිතයට ඉඩදෙනු ලැබේ.

**1.** අනිල් සමාගම විවිධ වර්ගයේ පින්තූර රාමු නිෂ්පාදනය කරයි. සමාගම විසින් ආන්තික ප්‍රමිත පිරිවැය ක්‍රමය භාවිත කරන අතර එය සමාගමේ පිරිවැය සඵලදායී ලෙස විමර්ශනය කිරීම සඳහා සහ මිල ප්‍රතිපත්තිය සරල කිරීම සඳහා පහසුකම් සපයයි. සමාගමේ වඩාත් ජනප්‍රිය පින්තූර රාමු නිෂ්පාදිතය වනුයේ 'නිෂ්පාදන *A*' ය. පහත සඳහන් අය වැය දත්ත මාර්තු මාසය සඳහා ලබා දී ඇත.

| | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.) |
|---|---|---|
| විකුණුම් | 1 450 | 7 250 000 |
| මූලික රාමුව සඳහා පිරිවැය | 355 | (1 775 000) |
| වීදුරු (එක් රාමුවකට වර්ග මීටර 0.25 බැගින් වර්ග මීටරයක පිරිවැය රු. 340) | 85 | (425 000) |
| කොකු සඳහා පිරිවැය (එකක් රු. 65 බැගින් එක් රාමුවකට කොකු 2 කි.) | 130 | (650 000) |
| ශ්‍රමය සඳහා (ශ්‍රම පැයක් රු. 1100 බැගින් රාමුවකට පැය 0.25 කි.) | 275 | (1 375 000) |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (එකලස් ශ්‍රම පැයක් රු. 130 බැගින් රාමුවකට පැය 0.25 කි.) | 32.5 | (162 500) |
| ස්ථාවර නිෂ්පාදන පිරිවැය | | (872 500) |
| ලාභය | | 1 990 000 |

*A* නිෂ්පාදනයෙන් මාර්තු මාසය සඳහා සමාගම විසින් ඒකක 4 960 ක් නිෂ්පාදනය කර අලෙවි කර ඇති අතර ඒ සඳහා වැය වූ සත්‍ය වියදම් පහත දී ඇත.

| | රු. |
|---|---|
| විකුණුම් | 7 291 200 |
| මූලික රාමු පිරිවැය (එකක් රු. 350 බැගින්) | (1 736 000) |
| වීදුරු සඳහා පිරිවැය (මුළු වර්ග මීටර 1 250 කි.) | (427 500) |
| කොකු සඳහා පිරිවැය (එකක් රු. 62.50 බැගින්) | (620 000) |
| ශ්‍රමය (පැය 1 220 කි) | (1 348 100) |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (ශ්‍රම පැය පදනම් කරගෙන) | (164 700) |
| ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය | (821 500) |
| ලාභය | 2 173 400 |

අවශ්‍ය වන්නේ ;

(i) ආන්තික පිරිවැය ක්‍රමය භාවිතා කරමින් මුල් අයවැය, විචල්‍ය අයවැය සහ සත්‍ය ප්‍රතිඵලය පෙන්වමින් ලාභ ප්‍රකාශනය පිළියෙල කිරීම. *(ලකුණු 03 යි)*

(ii) පහත සඳහන් විචලායන් ගණනය කරන්න. *(ලකුණු 14 යි)*
මූලික රාමු මිල සහ මූලික රාමු භාවිත විචලනය
වීදුරු මිල සහ වීදුරු භාවිත විචලනය
කොකු මිල සහ කොකු භාවිත විචලනය
ශ්‍රම අනුපාත සහ ශ්‍රම කාර්යක්ෂමතා විචලනය
විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය වියදම් සහ කාර්යක්ෂමතා විචලනය
ස්ථාවර නිෂ්පාදන වියදම් විචලනය
විකුණුම් මිල සහ පරිමා විචලනය

(iii) මුල් අයවැයගත ලාභය සහ සත්‍ය ලාභය සංසන්දනය කිරීමේ ප්‍රකාශනයක් පිළියෙල කිරීම *(ලකුණු 03 යි)*

*(මුළු ලකුණු 20 යි)*

[දෙවන පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



**2.** අනෝමා සමාගම 'කැපීම්' සහ 'නිම කිරීම්' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් සහ 'ගබඩා' සහ 'නඩත්තු පහසුකම්' යන සේවා දෙපාර්තමේන්තු දෙකක් ද සහිතව නිෂ්පාදන කටයුතු කරගෙන යයි. නිෂ්පාදන පොදු කාර්ය අවශෝෂණය සඳහා සම්ප්‍රදායික පිරිවැය ක්‍රමය සමාගම විසින් භාවිතා කරයි. අගෝස්තු මාසය සඳහා පහත සඳහන් අයවැය තොරතුරු ඉදිරිපත් කර ඇත.

| | එකතුව (රු.) | කැපීම් (රු.) | නිමකිරීම් (රු.) | ගබඩා (රු.) | නඩත්තු පහසුකම් (රු.) |
|---|---|---|---|---|---|
| සෘජු ශ්‍රමය | 408 990 | 111 510 | 297 480 | - | - |
| වක්‍ර ද්‍රව්‍ය | 52 390 | 25 100 | 17 250 | 1 800 | 8 240 |
| විදුලිය | 280 300 | | | | |
| කර්මාන්තශාලා කුලී | 164 500 | | | | |
| යන්ත්‍ර ක්ෂය | 84 800 | | | | |
| කර්මාන්තශාලා රක්ෂණය | 26 200 | | | | |
| කර්මාන්තශාලා ආරක්ෂණ වියදම් | 42 500 | | | | |
| පරිපාලන වියදම් | 56 250 | | | | |

අගෝස්තු මාසය සඳහා සමාගමේ අයවැයගත කටයුතු පිළිබඳ තොරතුරු පහත දී ඇත.

| | එකතුව | කැපීම් | නිමකිරීම් | ගබඩා | නඩත්තු පහසුකම් |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර පැය | 220 000 | 209 000 | 11 000 | – | – |
| සෘජු ශ්‍රම පැය | 33 050 | 8 260 | 24 790 | – | – |
| භූමි ප්‍රදේශය වර්ග මීටර | 1 000 | 500 | 200 | 200 | 100 |
| ගබඩා නිකුත් කිරීම්වල වටිනාකම (රු.) | 200 000 | 180 000 | 20 000 | – | – |
| කිලෝ වොට් පැය | 10 | 6 | 2 | 1 | 1 |
| සේවක සංඛ්‍යාව | 90 | 20 | 60 | 4 | 6 |

අවශ්‍ය වන්නේ ;

(i) බෙදාහැරීමේ පදනම පැහැදිලිව දක්වමින් දෙපාර්තමේන්තු හතර සඳහා අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය බෙදාහැරීමේ ලේඛනය පිළියෙළ කිරීම. *(ලකුණු 06 යි)*

(ii) සේවා දෙපාර්තමේන්තුවල පොදු කාර්ය නැවත බෙදාහැරීමෙන් පසු නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකෙහි නිෂ්පාදන පොදු කාර්ය ගණනය කිරීම. *(ලකුණු 02 යි)*

(iii) නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සඳහා කලින් තීරණය කරන ලද අන්තර් ග්‍රහණ අනුපාත ගණනය කිරීම. *(ලකුණු 03 යි)*

(iv) සමාගමේ නිෂ්පාදනයක් වන 'විශාල භාජනයක්' සඳහා අදාළ තොරතුරු පහත දී ඇත. එම තොරතුරු ඇසුරින් විශාල භාජනයක පිරිවැය ගණනය කරන්න.

සෘජු ද්‍රව්‍ය පිරිවැය රු. 0.33

සෘජු ශ්‍රමය – කැපීම් අංශයෙන් මිනිත්තු 0.5

– නිම කිරීම් අංශයෙන් මිනිත්තු 1

යන්ත්‍ර පැය – කැපීම් අංශයෙන් මිනිත්තු 2

– නිම කිරීම් අංශයෙන් මිනිත්තු 0.25 *(ලකුණු 05 යි)*

(v) ඌන අන්තර්ග්‍රහණය (under absorption) සහ අධි අන්තර්ග්‍රහණය (over absorption) අතර වෙනස පැහැදිලි කර ඒවා සඳහා ගිණුම් තබන ආකාරය දක්වන්න. *(ලකුණු 04 යි)*

*(මුළු ලකුණු 20 යි)*

[තුන්වන පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



**3.** මහජන ක්‍රීඩා සමාජය මීට මාස දෙකකට පෙර මෙහෙයුම් ආරම්භ කර ගනුදෙනුකරුවන්ට විවිධ යෝග්‍යතා ක්‍රියාකාරකම් හඳුන්වා දී ඇත. මිශ්‍ර ක්‍රියාකාරකම් සහ යෝග්‍යතා නැටුම් යනුවෙන් නව ක්‍රියාකාරකම් දෙකක් සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. එම යෝජනා දෙකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | මිශ්‍ර ක්‍රියාකාරකම් | යෝග්‍යතා නැටුම් |
|---|---|---|
| එක් පන්තියක් සඳහා එක් අයෙකුගෙන් අය කරන ගාස්තුව | රු. 700 | රු. 800 |
| වාර්ෂික රක්ෂණයට | රු. 140 000 | රු. 120 000 |
| සංගීතය සහ පුරස්කාර ගාස්තු | එක් පන්තියක් සඳහා රු. 3 200 | එක් පන්තියක් සඳහා රු. 3 400 |
| වාර්ෂික විදුලි සහ පරිපාලන වියදම් | රු. 25 360 | රු. 25 360 |
| උපදේශක ගාස්තු | එක් පන්තියක් සඳහා රු. 5 000 | වර්ෂය සඳහා රු. 330 000 |
| එක් පන්තියක් සඳහා අපේක්ෂිත ගණන | 50 | 40 |

අවශ්‍ය වන්නේ ;

(i) ඒ ඒ යෝජනාව සඳහා වෙන වෙනම සමච්ඡේද ලක්ෂ්‍යය (breakeven point) රුපියල්වලින් ගණනය කිරීම. *(ලකුණු 06 යි)*

(ii) ක්‍රීඩා සමාජය මිශ්‍ර ක්‍රියාකාරකම් වැඩසටහනෙන් රු. 10 000 ක ලාභයක් ලැබීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා පන්ති වාර කීයක් පැවැත්විය යුතු ද? *(ලකුණු 04 යි)*

(iii) යෝජනා දෙක සඳහා ම වෙන වෙන ම එක් පන්තියක් සඳහා අය කරන මිල රු. 700 ක් යැයි උපකල්පනය කර යෝග්‍යතා නැටුම් පන්තියෙන් උපයන ලාභයට සමාන ලාභයක් ඉපයීම සඳහා මිශ්‍ර ක්‍රියාකාරකම් පන්තියෙන් පැවැත්විය යුතු පන්ති වාර ගණන ගණනය කරන්න. *(ලකුණු 05 යි)*

(iv) ක්‍රීඩා සමාජය විසින් මිශ්‍ර ක්‍රියාකාරකම් උපදේශක සඳහා එක් පන්තියක් සඳහා ගාස්තු ගෙවනවා වෙනුවට වර්ෂය සඳහා ම රු. 260 000ක් ගෙවන්නේ නම් නව සමච්ඡේද ලක්ෂ්‍යය ගණනය කරන්න. ක්‍රීඩා සමාජය මෙම යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු ද නැද්ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(v) පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණයේ (cost-volume-profit model analysis) උපකල්පන හතරක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 20 යි)*

**4.** කමල් සමාගම කුඩා පොත් රාක්ක නිෂ්පාදනය කරයි. සමාගම විචල්‍ය පිරිවැයකරණය නිෂ්පාදිත පිරිවැය ගණනය කිරීම සහ තොග තක්සේරු කිරීම සඳහා භාවිතා කරයි. 2020 ජුනි මාසයෙන් අවසන් කාර්තුව සඳහා ඇස්තමේන්තු තොරතුරු පහත දී ඇත.

2020 අප්‍රේල් 1 දිනට තොග :

කුඩා පොත් රාක්ක ඒකක 1 500

දැව ඒකක 2 000

ඉදිරි මාස හතර සඳහා ඇස්තමේන්තු විකුණුම් (රු.)

| අප්‍රේල් | මැයි | ජුනි | ජූලි |
|---|---|---|---|
| 4 950 000 | 3 690 000 | 5 400 000 | 4 320 000 |

[හතරවන පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



කුඩා පොත් රාක්කයක විකුණුම් මිල රු. 900 කි.

කුඩා පොත් රාක්කයක ප්‍රමිත පිරිවැය පත්‍රය පහත දැක්වේ.

| | රු. |
|---|---|
| දැව (ඒකකයක් රු. 240 බැගින්) | 360 |
| සෘජු ශ්‍රමය (පැයක් රු. 164 බැගින්) | 205 |
| විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය (සෘජු ශ්‍රම පැයක් සඳහා රු. 60 බැගින්) | 75 |
| එකතුව | **640** |

ඊළඟ මාසයේ විකුණුම්වලින් 20% කට සමාන ප්‍රමාණයක් අවසන් නිමි තොග ලෙස සෑම මාසයකම අග පවත්වාගෙන යයි.

2020 අප්‍රේල් 01 දින ඇති දැව තොග මෙන් දෙගුණයක් දැව අවසන් තොග ලෙස තබා ගැනීම 2020 දෙසැම්බර් 31 දින දක්වා සිදු කරන බව ඔබට දන්වා ඇත. 2020 ජුනි 30න් අවසන් කාර්තුව සඳහා ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය සහ නිෂ්පාදන නොවන පොදු කාර්ය පිළිවෙළින් රු. 300 000 සහ රු. 400 000 ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

අවශ්‍ය වන්නේ ;

(i) 2020 ජුනි 30 න් අවසන් කාර්තුව සඳහා ඒකකවලින් නිෂ්පාදන අයවැය ලේඛනය (ලකුණු 05 යි)

(ii) 2020 ජුනි 30 න් අවසන් කාර්තුව සඳහා ඒකකවලින් සහ රුපියල්වලින් ද්‍රව්‍ය ගැනුම් අයවැය ලේඛනය (ලකුණු 06 යි)

(iii) 2020 ජුනි 30 න් අවසන් කාර්තුව සඳහා ශ්‍රම පිරිවැය අයවැය ලේඛනය (පැය සහ රුපියල් වලින්) (ලකුණු 03 යි)

(iv) 2020 ජුනි 30 න් අවසන් කාර්තුව සඳහා විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අයවැය ලේඛනය (ලකුණු 02 යි)

(v) 2020 ජුනි 30 න් අවසන් කාර්තුව සඳහා අයවැයගත ආදායම් ප්‍රකාශනය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**5.** (i) කුමාර් සමාගමේ පෙරසැරියකට අදාළ තොරතුරු පහත දී ඇත.

| | |
|---|---|
| ආරම්භක නොනිමි වැඩ | ඒකක 6000ක්, (30% පරිවර්තන පිරිවැය අතින් සම්පූර්ණ වේ.) නොනිමි තොගයේ වටිනාකම රු. 80 000 |
| කාලපරිච්ඡේදය සඳහා දරන ලද පිරිවැය | සෘජු ද්‍රව්‍ය ඒකක 40 000 ක් රු. 324 000 |
| | සෘජු ශ්‍රමය රු. 100 200 |
| | නිෂ්පාදන පොදු කාර්ය රු. 100 000 |
| සත්‍ය නිමැවුම | නිමි ඒකක 32 000. නොනිමි තොග ඒකක 8 000. 40% පරිවර්තන පිරිවැය අතින් සම්පූර්ණය |

ක්‍රියාවලිය ආරම්භයේ දී සෘජු ද්‍රව්‍ය එකතු කරන අතර තොග ගණනය කිරීම ප්‍රථමයෙන් ලද ප්‍රථමයෙන් නිකුත් කිරීම් අනුව සිදු කරයි (FIFO). යෙදවුම්වලින් 10% සාමාන්‍ය අපතය ලෙස සැලකෙන අතර එම අපතය, සෘජු අමුද්‍රව්‍ය එකතු කළ විගස නමුත් අනෙකුත් පිරිවැය මූලිකාංග එකතු කිරීමට පෙර හඳුනා ගනී.

අවශ්‍ය වන්නේ ;

(අ) පෙරසැරි ගිණුම පිළියෙල කිරීම (ලකුණු 05 යි)

(ආ) සමානුපාතික ඒකක ලේඛනය, ඒකක පිරිවැය පෙන්නුම් කරමින් පිළියෙල කිරීම (ලකුණු 07 යි)

(ii) ''අයවැය ලේඛනය රජයේ ප්‍රතිපත්ති සම්පාදන ලියකියවිල්ලක් වන අතර එමගින් රජයේ අරමුණු ළඟා කර ගැනීමට උපක්‍රම සහ සම්පත් භාවිතය පිළිබඳ සන්නිවේදනය කරයි.''

(අ) 'අයවැයකරණය යහපාලනය (budgetary governance)' සහ 'අයවැයකරණ ආයතන (budgetary institutions)' සංකල්ප කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ආ) රාජ්‍ය අංශයේ අයවැයකරණ ආයතන අටක් නම් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

***

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE

7920

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත / විවෘත තරග විභාගය – 2017/2018 (2020)

## (04) විගණනය හා විමර්ශනය

පැ. තුනයි

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

**1.** ඔබ සීමාසහිත *ABC* පොදු සමාගමේ (PLC) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ විගණනය භාර විගණකයා යයි උපකල්පනය කරන්න.

(i) සනාථ කිරීම් ලිපි යැවීම සඳහා ණයගැතියන්ගෙන් නියැදියක් (sample) තෝරා ගැනීමේ දී ඔබ සලකා බලන නිර්ණායක (criteria) හතරක් ලැයිස්තුගත කරන්න. *(ලකුණු 04 යි)*

(ii) "විගණකවරුන් විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයන් සිදු කළ යුතුය." ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයක් සිදු කිරීමට ඇති අවශ්‍යතා හතරක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(iii) සමාගමකට අයත් ඉඩම්වල අදාළ මූල්‍ය ප්‍රකාශන සඳැහුම් (financial statement assertions) හතරක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iv) වෙළඳ ණයගැතියන් (trade receivables) සම්බන්ධයෙන් ඔබ විසින් ඉටු කරනු ලබන තහවුරු විගණන ක්‍රියාපටිපාටි (substantive audit procedures) හතරක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**2.** (i) සමාගම අඛණ්ඩ පැවැත්මක් ඇති ආයතනයක්ද යන්න නිගමනය කිරීම සඳහා විගණක විසින් යොදා ගන්නා විගණන ක්‍රියාපටිපාටි තුනක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) තොරතුරු තාක්ෂණය (IT) භාවිතය මගින් අස්තිත්වයක (entity) අභ්‍යන්තර පාලනයන්ට විශේෂිත අවදානම් සහිත ප්‍රශ්න ඇති කරයි.
එවැනි අවදානම් තුනක් ලැයිස්තුගත කරන්න. *(ලකුණු 04 යි)*

(iii) අභ්‍යන්තර පාලනවල ඇති ආවේණික සීමා (inherent limitations) හතරක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iv) "අභ්‍යන්තර විගණන කාර්යයේ අරමුණු පුළුල් ලෙස වෙනස්වන අතර එය අදාළ අස්තිත්වයේ විශාලත්වය හා ව්‍යුහය මත ද කළමනාකරණයේ අවශ්‍යතාවය මත ද රඳා පවතී." අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාකාරකම් හතරක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**3.** (i) ගණකාධිවරයකුගේ වෘත්තීය ආචාරධර්මානුකූල හැසිරීම කෙරෙහි ඇතිවන තර්ජන හතරක් ලැයිස්තුගත කරන්න. *(ලකුණු 04 යි)*

(ii) වෘත්තීය ගණකාධිකාරිවරයෙක් සියළුම අවස්ථාවලදී රහස්‍යභාවය ආරක්ෂා කළ යුතුය. වෘත්තීය ගණකාධිකාරිවරුන් විසින් රහස්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතු වන හා කළ හැකි හෝ එවැනි තොරතුරු හෙළිදරව් කිරීම යෝග්‍ය වන අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 04 යි)*

(iii) වංචනික මූල්‍ය වාර්තාකරණය යන්නට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් රැවටීම සඳහා හිතාමතා මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ප්‍රකාශන අඩංගු කිරීම ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නකුට වංචනික මූල්‍ය වාර්තාකරණය ඉටුකර ගත හැකි ආකාර තුනක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iv) මූල්‍ය ප්‍රකාශනයන් සමස්තයක් වශයෙන් ගත් කළ ප්‍රමාණාත්මක සාවද්‍යතාවලින් (material misstatments) තොර බවට නිගමනය කිරීමට අවශ්‍ය අදාළ හා ප්‍රමාණවත් සාක්ෂි ලබා ගැනීමට නොහැකි වූ විට විගණකට වාර්තාවෙහි තම මතය විකරණය (modify) කිරීමට අවශ්‍ය වේ.
විගණකට එලෙස සාක්ෂි ලබා ගැනීමට නොහැකිවන අවස්ථා තුනක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

[දෙවන පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



**4.** (i) සමාගමක විගණකයකු ලෙස පත්කළ නොහැකි හෝ ක්‍රියාකළ නොහැකි තැනැත්තන් දෙදෙනකු සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) විගණක විසින් ඉල්ලා සිටින ලද ලිඛිත නියෝජනයන් ලබාදීම අස්තිත්වයේ කළමනාකාරිත්වය ප්‍රතික්ෂේප කර ඇත. එවැනි අවස්ථාවකදී විගණකට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) සමාගමක් තුළ සම්බන්ධිත පාර්ශවයන් හඳුනාගැනීම සඳහා විගණකයකු විසින් ඉටු කරනු ලබන විගණන පරිපාටි තුනක් ලැයිස්තුගත කරන්න. *(ලකුණු 06 යි)*

(iv) විගණන ලේඛනගත කිරීම්වල (Audit documentation) ස්වරූපය, අඩංගු වන කරුණු හා ප්‍රමාණය තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක තුනක් ලැයිස්තුගත කරන්න. *(ලකුණු 06 යි)*

**5.** පහත මාතෘකා පිළිබඳ කෙටිසටහන් ලියන්න.

(i) විශේෂඥයා (expert)

(ii) වෙන්කිරීම් හා අසම්භාව්‍යයන් (provisions and contigencies)

(iii) වාර්තා කිරීමේ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් (events after the reporting period)

(iv) ගණකාධිකරණ ප්‍රතිපත්ති (Accounting policies)

*(ලකුණු 05 × 4 = 20 යි)*

***

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE 7920

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත / විවෘත තරග විභාගය – 2017/2018(2020)

## (06) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය

පැ තුනයි

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

**1.** (i) ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි පිළියෙල කරන ලද වාර්ෂික කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවෙන් සම්මත වීම දක්වා වූ පියවර කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධි ශ්‍රේණියට උසස් කරනු ලැබූ එස්. සිරිමෙවන් මහතා *XY* දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස 2020 ජනවාරි 01 දින රාජකාරී භාරගන්නා ලදී. ගනන්දීමේ නිලධාරියා වශයෙන් ඔහු තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය පවත්වාගෙන යාම පිළිබඳව වගකිවයුතු බැවින්, මුදල් රෙගුලාසි අනුව මූල්‍ය පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම පිළිබඳව ඔහුගේ අවධානය යොමු වී ඇත.
ගණන්දීමේ නිලධාරියකු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා, මුදල් රෙගුලාසි 135 අනුව මූල්‍ය පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීමේ දී කුමන කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු ද? (ලකුණු 07 යි)

(iii) සහතික කරන ලද රජයේ වවුචර් පත්‍රයක් ගෙවීම් සිදු කිරීම සඳහා බලයලත් ගෙවීම් නිලධාරියා වෙත යොමු කරනු ලැබේ. මෙහිදී බලයලත් ගෙවීම් නිලධාරියා විසින් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් තම ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු කරුණු මොනවා ද? (ලකුණු 08 යි)

**2.** (i) සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(අ) එසේ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනවලින් ප්‍රධාන ප්‍රකාශන තුන නම් කරන්න. (ලකුණු 03 යි)

(ආ) ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් සහතික කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් වෙත ද? (ලකුණු 02 යි)

(ii) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ගිණුම් අංශවල සේවය කරන නිලධාරීන් සඳහා "රජයේ කාර්යාලවල ලියා අවසන් කරන ලද උප පත්‍රිකා පොත් විනාශ කිරීම" යන මාතෘකාව යටතේ දේශණයක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වශයෙන් ඔබ වෙත ආරාධනා කර ඇත.
ඔබගේ දේශණයේ දී රජයේ මුදල් රෙගුලාසි අනුව රජයේ කාර්යාලවල ලියා අවසන් කරන ලද උප පත්‍රිකා පොත් විනාශ කිරීම සඳහා ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 07 යි)

(iii) *ABC* දෙපාර්තමේන්තුව සතුව පැවති ගබඩාව තුළ තිබූ පරිගණක යන්ත්‍ර කිහිපයක් නැති වී ඇති බව ගබඩා භාරකරු, ගබඩා නිලධාරියා මගින් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ලිඛිතව වාර්තා කර ඇත. කිසියම් අයකු විසින් ගබඩාවේ දොර විවෘත කර එම භාණ්ඩ ගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වන බවත්, ඒ පිළිබඳව පොලිසිය වෙත ද, පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත් එම ලිපියේ සඳහන්ව ඇත.
දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ පිළිබඳව පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම සඳහා පත් කළ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ඔබ පත් කර ඇත්නම්, ඔබ කමිටුව විසින් මේ සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණයෙන් අනතුරුව මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 'පූර්ණ වාර්තාවට (full report)' ඇතුළත් කරනු ලබන කරුණු මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



**3.** (i) දෙපාර්තමේන්තුවක් විසින් වාර්ෂික කෙටුම්පත් ඇස්තමේන්තුවල නව අත්තිකාරම් ගිණුමක් ඇති කිරීම සඳහා පූර්ව අධිකාරී බලය ලබාගත යුත්තේ කවුරුන් වෙතින් ද? *(ලකුණු 02 යි)*

(ii) එලෙස අධිකාරී බලය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයෙහි ඇතුළත් විය යුතු විස්තර මොනවාදැයි සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

(iii) "දෙපාර්තමේන්තුවල වාර්ෂික කෙටුම්පත් ඇස්තමේන්තු, රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ."
ගණන්දීමේ නිලධාරියා වශයෙන් මුදල් රෙගුලාසි අනුව මෙහි දී විශේෂයෙන් සැලකිය යුතු කරුණු මොනවා දැයි සඳහන් කරන්න. *(ලකුණු 08 යි)*

**4.** (i) රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය හා මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීම තුළින් ළඟාකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු මොනවාදැයි සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවකින් ඉටු කිරීමට නියම කර ඇති වගකීම් මොනවාදැයි සඳහන් කරන්න. *(ලකුණු 08 යි)*

(iii) ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවදානම අවමකර ගැනීම සඳහා යොදාගනු ලබන සුරක්ෂණ (security) වර්ග දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

**5.** (i) හදිසි කාලගුණික විපර්යාසයක් නිසා ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුමට ඇති වූ ධාරානිපාත වර්ෂාව හේතුවෙන් කැළණි ගඟ පිටාර ගැලීමක් සිදු වී ඇත. මෙම හේතුවෙන් කැළණි ගඟ දෙපස ජීවත් වූ පවුල් විශාල සංඛ්‍යාවක් ආපදාවට ලක්වී ඇති අතර එම පවුල් සඳහා කඩිනමින් සහන සැලසීමට උපදෙස් ලැබී ඇත. නමුත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට සහන සැලසීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන අයවැය ලේඛනයෙන් වෙන් කර නොමැති බව අනාවරණය වී ඇත.

(අ) මෙවැනි අවස්ථාවක මුදල් සපයා ගැනීමට නෛතික වශයෙන් පිහිටුවා ඇති අරමුදල කුමක් ද? *(ලකුණු 02 යි)*

(ආ) එම අරමුදලින් මුදල් නිදහස්කර ගැනීම සඳහා යෝග්‍ය වන අවස්ථා මොනවාදැයි සඳහන් කරන්න. *(ලකුණු 06 යි)*

(ඉ) එම අරමුදලින් මුදල් නිදහස්කර ගැනීමට අනුමැතිය ලබා දෙන්නේ කවුරුන් විසින් ද? *(ලකුණු 02 යි)*

(ii) රජයේ දෙපාර්තමේන්තුවකට යම් විශේෂ කටයුත්තක් සඳහා යෙදවීමට මුදලින් ලැබෙන මහජන ත්‍යාග එකී මුදල් ලබා ගැනීමේ සිට රාජ්‍ය ආදායමට බැර කිරීම දක්වා වූ ක්‍රියාවලිය සැකෙවින් සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

***